## බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.10.29

වේලාව : පෙ.ව.10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ ඃ-**

| | |
|---|---|
| 02. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |

**නිලධාරී සහභාගීත්වයඃ-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිමඃ**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදනඃ**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන මහ සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලාත් , ලේකම් මහතා සහ පුවත්පත් කලාවේ දී මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන්ම පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන නවීකරණය කිරීම සඳහා සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟතාවය මත සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන සියල්ලටම මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබූ අතර , ඒ අනුව මෙම සභාවට ද ලක්ෂ 20 ක මුදලක් කාර්යාල නවීකරණය සඳහා ලැබුණු බව සඳහන් කරන ලදී. එම මුදල උපයෝගී කරගෙන කාර්යාල නවීකරණය හා නව සභා ගර්භය සකස් කිරීමට කටයුතු කරමින් පවතින බැවින් , නියමිත ස්ථානයේ සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බවත් , එම නිසා ගරු මන්ත්‍රීතුමන්ලා යම් අපහසුතාවකට පත්වූවා නම්, ඒ සම්බන්ධව සමාව අයදින බව දැන්වීය.

පසුගියදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් විසින් දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන නියෝජිතයින් අරලියගහ මන්දිරයට කැඳවා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත් වූ අතර , පළාත් පාලන ආයතන නියෝජිතයින් විසින් මහජනතාව වෙනුවෙන් ඉටුකරනු ලබන කාර්යභාරය විශේෂ ඇගයීමකට ලක්කල බව දිර්ඝ වශයෙන් කරුණු දක්වමින් සදහන් කරන ලදී.

.තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා , 2010 වර්ෂය සදහා අයවැය සකස් කිරීමේ කාර්යය සිදුකරගෙන යනු ලබන අතර , මෙම අයවැය තුළින් ජනතාවට පළුදායී සහ ගුණාත්මක සේවයක් කිරීමට හැකිවන පරිදි අයවැය සකස් කරන ලෙස තමන් අදාල නිලධාරීන් වෙත දැණුම් දුන් බව සදහන් කරමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2009.09.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2009.09.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රීඑම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **නිවාඩු අනුමත කිරීම - ගරු නාගරික මන්ත්‍රී,ධර්මසේන සමරසිංහ මැතිතුමා**

අසනීප තත්ත්වයෙන් පසුවන නිසා , අද දින පැවැත්වෙන මාසික මහ සභා රැස්වීමට සහභාගීවිය නොහැකි බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා දුරකථනයෙන් දැණුම් දුන් බව ගරු සභාපතිතුමා සභාව වෙත දන්වන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **පාසැල් 3 R වැඩ සටහන :**

බළන්ගොඩ නගර සභාව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන පාසැල් 3 R වැඩ සටහනට අදාළ සම්පත් කේන්ද්‍ර ඇතිකිරීමේ ව්‍යාපෘතියේ සමස්ථ වියදම පහත දැක්වෙන අතර , අදාළ මුදල සහා අරමුදලින් ගෙවීමට අනුමැතිය පතමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. ඉදිකිරීම් සඳහා යන මුළු වියදම | රු. 1327900.00 |
| 02. සම්පත් කේන්ද්‍ර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | රු. 25000.00 |
| 03. Point Card මුද්‍රණය | රු. 30000.00 |
| 04. දැනුවත් කිරිමේ වැඩ සටහන සඳහා | රු. 70000.00 |
| 05. සම්පත් කේන්ද්‍ර ආරම්භ කිරිමේ මුළික වියදම ( අත්තිකාරම් මුදල් ) | **රු. 25000.00** |
| | රු. 1477900.00 |

මෙම මුදලින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජාතික ඝන අපද්‍රව්‍ය සහායක මධ්‍යස්ථානයෙන් ලැබෙන මුදල් ප්‍රමාණය ,

| | |
|---|---|
| i. සම්පත් කේන්ද්‍ර 05 ඉදිකිරිම | රු.995925.82 |
| ii. අත්තිකාරම් මුදල් ( සම්පත් කේන්ද්‍ර පටන් ගැනීමට) | රු.25000.00 |

iii. අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම( තරාදි / මුදල් සේප්පු ) **රු.25000.00**

රු.1045925.82

මධ්‍යම පරිසර අධිකාරියේ ප්ලාස්ටික් පසුභාවිත ව්‍යාපෘතිය මගින් ,

i. දැනුවත් කිරීම් සඳහා රු.57540.00

ii. අවශ්‍ය කසල රැස්කරන බෑග් Learn Asiya ආයතනය මගින් රු.2000.00

iii. Point Card 10000 මුද්‍රණයට රු.30000.00

ලැබෙන අතර , ඉතිරි මුදල නගර සභාවෙන් දැරිය යුතුවේ.

| | |
|---|---|
| සම්පත් කේන්ද්‍ර කිරීමේ ඉතිරි මුදල | රු.331975.28 |
| අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට ඉතිරි මුදල | රු.25000.00 |
| ලේඛන සඳහා අවශ්‍ය පොත් සඳහා | රු. 5000.00 |
| එක් මධ්‍යස්ථානයක දැන්වීම් පුවරු 03 බැගින් (ඩිජිටල්) දැන්වීම් පුවරු 15 ක් | **රු. 15000.00** |
| -එකතුව | **376975.28** |

ඉහත සඳහන් මුදල සහා අරමුදලින් දැරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

05:03 **වැඩ පරිපාලකවරයෙකු සේවයට යොදා ගැනීම:**

ප්‍රිමෙක්ස් නිෂ්පාදනය , ප්‍රිමෙක්ස් ඇතිරීම,පොත්පත් සැකසීම , සහා කාර්මාන්ත පරීක්ෂාව හා අනෙකුත් සෘජු කම්කරු ශ්‍රමය යොදා කරනු ලබන කර්මාන්ත පරීක්ෂාවට සිටිනුයේ එක් වැඩ පරිපාලකවරයෙකු වන නිසා , රාජකාරී ඉටුකිරීමේ දී අපහසුතාවලට ලක්වීමට සිදුව ඇති බැවින් , දෛනික වැටුප් ගෙවීමේ පදනම මත වැඩ පරිපාලකවරයෙකු බඳවා ගන්නේ නම්, වඩාත් කාර්යක්ෂමව, නිවැරදිව සහ කලට වේලාවට රාජකාරී ඉටුකරගත හැකි බව දන්වමින් , කාර්මික නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පෙර නිමවුම් අංගනය බැංකියවත්තේ කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති බැවින් , එය අධීක්ෂණය කරන මිලින් මනෝජ් මහතා ලවා අදාළ කාර්යය ඉටුකරගැනීමටත් , සේවා ගිවිසුමකට යටත්ව මුරකරුවෙකු බඳවා ගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **මලාපවහන ප්‍රතිකර්ම පද්ධතිය - බළන්ගොඩ නගර සභාව**

උක්ත කරුණට අදාළව , ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, එල්.මංගලිකා මහත්මිය විසින් එවා ඇති 2009.10.16 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ සේවය කරන ජපාන ජාත්‍යන්තර විශේෂඥ කණ්ඩායම 2009.10.13 වන දින මෙම නගර සභාවේ ක්‍රියාත්මක කරන ලද මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතිය පරික්ෂා කර බලා පහත දැක්වෙන වැඩිදියුණු කිරීම් කල යුතු බව වාර්තා කර ඇති බැවින් , එම අවශ්‍ය වැඩිදියුණු කිරීම් ඉටුකිරීමට කටයුතු සම්පාදනය කරන ලෙස එමගින් දන්වා තිබිණ.

- ❖ මළ අපද්‍රව්‍ය නිදහස් කරන ටැංකිය (Receiving Tank ) සහ ( Sedimataion Tank ) සඳහා ආවරණ යෙදීම. මෙය ශක්තිමක් දැව වලින් ද කල හැකි.

අඹ දැවය යොදාගනිමින් අදාළ ආවරණ සකස් කිරීමටත් , බස්නැවතුම්පලෙන් ඉවත් කරන අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා වෙනත් ටැංකියක් සැකසීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **පළාත් පාලන ආයතනවල වාහන භාවිතය**

පළාත් පාලන ආයතන සතු වාහන පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි වන අවස්ථාවලදී යම් ගැටළු වලට මුහුණ දීමට සිදුවන බැවින් , තම පළාත් පාලන ආයතනය සතුව ඇති සහා අරමුදලින් නඩත්තු කරනු ලබන සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම පැහැදිලිව පෙනෙන සේ භාෂාත්‍රයෙන්ම සටහන් කරන මෙන් ඉල්ලා , සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදුව , යථෝක්ත ඉල්ලීම ඉටුකිරීමට සභාවේ එකඟතාවය පළකරන ලදී.

05:06 **සෞඛ්‍ය අංශයේ දෛනික කටයුතු සඳහා සෞඛ්‍ය පරිපාලකවරයෙකු හා බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා කම්කරුවන් සේවයට යොදවා ගැනීම.**

ඉහත සඳහන් කරුණට අදාළව , විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

සෞඛ්‍ය අංශයේ දෛනික කටයුතු ඉටුකරගැනීම සඳහා සෞඛ්‍ය පරිපාලකවරයෙකු පත්කරගැනීම අත්‍යාවශ්‍ය වන අතර , බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ද කම්කරුවන් කිහිප දෙනෙකු සේවයට යොදවා ගත යුතු බැවින් , ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

සම්මුඛ පරීක්ෂණයක් මගින් සෞඛ්‍ය පරිපාලකවරයෙකු ( සේවා ගිවිසුමකට යටත්ව ) බඳවා ගැනීමටත් , කොම්පෝස්ට් ව්‍යාපෘතියට සභාව මගින් කම්කරුවන් පුහුණුකර බඳවා ගැනීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. කම්කරුවන් බඳවා ගැනීමේ දී කොම්පෝස්ට් ව්‍යාපෘතිය අවට පදිංචිකරුවන් හට ප්‍රමුඛතාව ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

05:07 **නඩු අංකය : 1140 - නීතිඥ ගාස්තු ගෙවීම**

උක්ත කරුණට අදාළව විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2009.10.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම සභාවට අයවිය යුතු රු.26235/- ක මුදල සඳහා අගරු චෙක්පතක් ලබාදීම වෙනුවෙන් ඉහත සඳහන් නඩුව 1999 වර්ෂයේ දී බළන්ගොඩ දිසා අධිකරණයේ පවරා ඇති අතර , නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර ඇති බැවින් , මෙම නඩුව සඳහා පෙනී සිටි නීතිඥ රෆික් මහතාට නීතිඥ ගාස්තු ලෙස රු.21095/- ක මුදලක් ගෙවිය යුතු බව ඒ මහතා සභාව වෙත දන්වා ඇත. සභාවට අයවිය යුතු මුදල රු.26235/- ක් වේ. ඒ අනුව අදාල නීතිඥ ගාස්තු ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධයෙන් සලකා බැලූ සභාව උක්ත නඩුව මහජන දේපළක් වෙනුවෙන් පවරන ලද්දක් වන හෙයින් මෙම සභාවට අයවිය යුතු මුදල සමඟ නීතිඥ ගාස්තු ද ඇස්කීසි නියෝගයෙන් අයකරගත හැකිනම්, එම අයකරගැනීම් කරගත් පසුව ඉල්ලීම්කරගනු ලැබූ නීතිඥ ගාස්තු ගෙවීමට තීරණය කරන ලදී.

05:08 **පාසැල් වල ඉදිකරනු ලබන සම්පත් කේන්ද්‍ර වල වැඩ ආරම්භ කිරීම සඳහා 20% ක අත්තිකාරම් ලබාගැනීම**

මෙම නගර සභාව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන 3 R ව්‍යාපෘතියට අදාළ සම්පත් කේන්ද්‍ර වල ඉදිකිරීම් කටයුතු භාරව කටයුතු කරනුයේ අදාළ පාසැල් වල පාසැල් සංවර්ධන සමිතිය වේ. සම්පත් කේන්ද්‍ර ඉදිකිරීමේ සියළු කටයුතු අවසන් කර 2009.11.27 දිනට ගරු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා අතින් විවෘත කිරීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් , කඩිනමින් අදාළ කාර්යයන් කරවා ගැනීමට 20% ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී. මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **කසල කරත්ත 03 ක් මිළදී ගැනීම :**

කසල වෙන් කිරීමේ කාර්ය වඩාත් පහසු කිරීම සඳහා කසල කරත්ත 03 ක් ලබාගැනීමට අනුමැතිය පතමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී. මේ සඳහා අනුමැතිය ලබාදුන් අතර , පරිබර් වර්ගයෙන් අදාළ කරත්ත සකස් කරවාගැනීමට තීරණය කරන ලදී.

5:10 **පොහොර හා ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාගැනීම වෙනුවෙන් අයවිය යුතු හිඟ මුදල් ලබාගැනිම සඳහා**

උක්ත කරුණට අදාළව විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම නගර සභාවේ ගරු උපසභාපති ගරු සුමේද චමින්ද බස්නායක මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාගෙන ඇති මුත් 2009.10.28 වන දින විටත් ඒ වෙනුවෙන් අයවිය යුතු මුදල් ලබා දී නොමැත.

ගරු උපසභාපතිතුමා විසින් 2008.06.02 වන දින පොහොර කිලෝ ග්‍රෑම් 5000 ක් ලබාගෙන ඇති අතර , ඒ වෙනුවෙන් රු.40,000/- ක මුදලක් අයවීමට ඇති අතර , මේ අනුව ගරු උපසභාපතිතුමාගෙන් හා ගරු මන්ත්‍රීතුමාගෙන් අයවිය යුතු මුදල් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ගරු උපසභාපතිතුමා | ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාගැනීම වෙනුවෙන් | රු.20,124.99 | |
| | පොහොරමිළදී ගැනීම වෙනුවෙන් | | **රු.40,000.00** |
| | | | **රු. 60,124.99** |
| ගරු ධර්මසේන සමරසිංහ මැතිතුමා - | ජේ.සී.බී.යන්ත්‍රයේ සේවා ලබාගැනීම වෙනුවෙන් | රු.26,600.00 | |
| | මුළු මුදල | | **රු.86,724.99** |

ඉහත ආකාරයට සභාවට අයවිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් කිහිපවිටකදීම විගණනයේ දී විමසුම් වලට ලක්කර ඇති අතර , මුදල් අයකරගැනීම සඳහා ද සිහි කැඳවීම් ද සිදුකොට ඇති බැවින් , සභාවට අයවිය යුතු ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , අවසාන නිවේදනයක් නිකුත් කර , පසුව එන්තරවාසියක් නිකුත් කිරීමටත් තීරණය කරන ලදී.

**05:11 ගලී බවුසරයේ සේවය ලබාගැනීම:**

බළන්ගොඩ නගරයේ සමෘද්ධිලාභියෙකු වන ජී.කේ.නිරූපා ශ්‍යාමලී යන අය ගලී බවුසරයේ සේවය ලබාගැනීමට ඉල්ලීමක් කර ඇති බැවින් , ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ නගර වසමේ සමෘද්ධි නිලධාරිණිය විසින් එවා ඇති 2009.10.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සහනදායී පදනම මත සමෘද්ධිලාභීන්ට ගලී බවුසරයේ සේවය සැපයීමට සභා අනුමැතියක් අවශ්‍ය බව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී තිබිණ.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , සමෘද්ධිලාභියෙකු වන නිසා 50% ක මුදලක් අයකර අදාළ සේවාව ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:12 අයකරගත නොහැකි හිඟ වරිපනම් බදු කපා හැරීම:**

පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද 2009.10.14 දිනැති අංක: සීඑල්ජී/1331 දරණ ලිපියෙන් අයකරගත නොහැකි හිඟ බදු මුදල් කපා හැරීමට ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා විධිමත්ව අදාල ලේඛන සකස් කර එවන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් , අයකරගත නොහැකි හිඟ වරිපනම් සම්බන්ධ වූ ලේඛනයක් ආදායම් අංශයෙන් සභාවට ඉදිරිපත් කර තිබුණි.

| කොට්ඨාස අංක: 06 - හපුතලේ පාර : | | | |
|---|---|---|---|
| වරිපනම් අංකය | ලේඛනගත අයිතිය | 2008.12.31 දිනට හිඟ මුදල | කපා හැරීමට හේතුව |
| 44 | එස්.එච්.වාණිජ්‍ය | 19744.36 | |
| 44/1 | -එම- | 2519.04 | |
| 44/2 | -එම- | 135.52 | |
| 48 | එම්.එම්.ජෝතිපාල | 3127.07 | |
| 50 | එම්.එම්.ජෝතිපාල | 6142.96 | |
| 50/ ඒ | ඒ.කේ.ප්‍රේමතිලක | 6142.96 | |
| 50/1 | තුඹගොඩ විහාර භාරකරුවෝ | 199.44 | |
| 50/2 | -එම- | 239.43 | |
| 54 | රජය | 237.11 | |
| කොට්ඨාස අංක: 06 දොරවෙල පාර : | | | |
| 06 | ජී.එම්.මෙන්ඩිස් අප්පු | 5057.20 | |
| 08 | අයිතිකරු - කිරිගනිතා | 176.86 | |
| 10 | එච්.එල්.ගුණතිලක | 169.32 | |
| 12 | යූ.බී.හනතා | 174.16 | |
| 14 | ජී.පුංචිගනිතා /එච්.එල්.ගුණතිලක | 173.26 | |
| 16 | ඩී.එමලින් හා පබ්ලිස් | 179.23 | |
| 18 | ඩී.බී.සුමනගුරු හා තවත් අය | 229.77 | |
| කොට්ඨාස අංක: 06 රත්නපුර පාර | | | |
| 216/3 | ලංකා ගමනා ගමන මණ්ඩලය | 12064.80 | |
| 216/4 | -එම- | 7529.56 | |
| 216/4/1/1 | -එම- | 7408.40 | |

| | | | |
|---|---|---|---|
| කොට්ඨාෂ අංකඃ 06 කල්තොට පාර ඃ | | | |
| 23 | පී.එල්ලාවල | 5944.36 | |
| 25 | පී.එල්ලාවල | 4418.12 | |
| හපුතලේ පාර ඃ | | | |
| 17/4 | එම්.එල්.එම්.අබුසාලි | 576.00 | |
| 1 | කතරගම දේවාලය | 9141.08 | |
| කොට්ඨාස අංකඃ 03 රත්නපුර පාර | | | |
| 30 | ජී.එච්.නිමලාවතී | 18472.56 | |
| | | 111414.69 | |

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ඉහත සඳහන් හිඟ වරිපනම් බදු අදාළ ලේඛන වලින් කපා හැරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05:13 ඇල්ලෙපොල පල්ලෙකුඹුර ගල් බැම්ම ගොඩහේන පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීමඃ**

බළන්ගොඩ විජය ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉහත කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු සාර්ථකව කඩිනමින් අවසන් කරන ලද අතර , තම සමිතිය විශාල මූල්‍ය අර්බුදයකට ලක්ව ඇති බැවින් , සභා අරමුදලින් අවසන් බිල්පත් පියවීම සඳහා මුදල් ලබාදෙන ලෙස ඉල්ලමින් සමිතියේ සභාපති විසින් එවා ඇති 2009.10.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු සාර්ථකව නිම කර ඇති බව කාර්මික නිලධාරී මහතා සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී ඇති බැවින් , මුදල් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **විනෝද බදු මුදල් අයකිරීම ඃ**

බළන්ගොඩ ජේ.එෆ්.සිනමා ශාලාවෙන් විනෝද බදු වශයෙන් ලැබුණු මුදල් 2009.08.20 දිනෙන් පසු අය නොවුණු බැවින් , ඒ පිළිබඳව එහි කළමනාකරුගෙන් ලිඛිතව විමසන ලදුව , එම ආයතනය දිගින් දිගටම පාඩු ලබමින් පවත්වාගෙන යන බැවින් , එය වසා දැමීමට සිදු වූ බව දන්වා ඇති බවත් , ඒ අනුව , මෙම ආයතනයට ලැබුණු විනෝද බදු මුදල් නොලැබෙන බවත් විෂය භාර නිලධාරි විසින් සභාව වෙත වාර්තා කර තිබුණි.

මේ සඳහා අවධානය යොමුකළ සභාව එයට එකඟතාව පළකරන ලදී.

05:15 **රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීමඃ**

මෙම නගර සභාව විසින් බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම සඳහා නිකුත් කරනු ලබන ලදුපත් සඳහා සභාවේ මුද්‍රාව තබා නොමැති බව විගණන විමසුම් වලදී පෙන්වාදෙන ලද බැවින් , ඒ සම්බන්ධව උපදෙස් පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම කාරණය පිළිබඳ අවධානය යොමුකළ මහ සභාව මෙම වර්ෂයේ දී තවත් ඉතිරිව ඇත්තේ මාස දෙකක් බැවින් හා දෙසැම්බර් 31 වන දින වන විට ටෙන්ඩරයේ කාලය අවසන්වන බැවින් 2010 වර්ෂය සඳහා පුවත්පත් දැන්වීම් පළකර ටෙන්ඩර් කැඳවීමටත්, එම

ටෙන්ඩරය ඉදිරි මහ සභා වාරයේ දී විවෘත කිරීමටත්, එහි දී කිරිඳගල පල්ලිය දක්වා නැවතුම් ගාස්තු අය කිරීමේ සීමාව වැඩි කිරීමටත් , දැනට ක්‍රියාත්මක වන ආකාරයටම වාහන හිමියන් වෙත ලදුපත් නිකුත්කරගෙන යාමට ඉඩහැර 2010 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අදාල ලදුපත් නගර සභාවේ මුද්‍රාව තබා මහජනයා වෙත නිකුත් කිරීමටත්, වාහන හිමියන් වෙත ලදුපත් නිකුත් කරන පුද්ගලයින් පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි නිල ඇඳුමක් සහ ලාංඡනයක් පැලඳීම අනිවාර්ය කිරීමටත්, තීරණයකර අනුමතිය ලබා දෙන ලදී.

05:16 **සුදර්ශනගම පානීය ජල ව්‍යාපෘතිය මගින් ජලය නොමැති නිවාස සදහා පානීය ජලය ලබාදීම:**

උක්ත කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

තුඹගොඩ වසමේ සුදර්ශනගම පානීය ජලය ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘතියේ ජලය පරිභෝජනය කරන්නන් සුදර්ශනගමට යාබඳ නිවෙස් වල පදිංචි ඊ.ජී.ගුණරත්න මැණිකේ හා සුනිල් රණතුංග යන අයට පානය සඳහා පමණක්වත් ජලය ලබාදීමට අකමැති බව තුඹගොඩ ග්‍රාම නිලධාරී විසින් තමා වෙත වාර්තා කර බැවින් , ඒ සම්බන්ධව සොයා බලා ඉහත සඳහන් අයට ජලය සපයා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා තිබිණ.

මේ පිළිබඳව සාකච්ඡා කල සභාව , සුදර්ශනගම ජල පාරිභෝගික සමිතිය වෙත මෙම ඉල්ලීම යොමු කරන ලෙස දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:17 **පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීම :**

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා වු කාලයට බළන්ගොඩ බස්නැවතුම්පල පොදු වැසිකිලිය පිරිසිදු කිරීම හා නඩත්තු කිරීමේ කාර්යය ටෙන්ඩර් කිරීම සුදුසු බව යෝජනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2009.10.28 දිනැති ලිපිය සභාගත කරන ලදී. අදාල ටෙන්ඩර් කිරීමේ කාර්යය සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **මහජන සෞඛ්‍යයට හානිදායක අයුරින් ඌරු කොටුවක් පවත්වාගෙන යාම :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයේ කන්‍යා සොයුරිය විසින් එවා ඇති 2009.10.12 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසය තුළ ඌරු කොටුවක් පවත්වාගෙන යනු ලබන්නේ සාධාරණ හේතු කිහිපයක් මුල් කරගෙන වන අතර , මෙම වැඩිහිටි නිවාසයේ 75 කට ආසන්න අසරණ වැඩිහිටියන් සහ වෙනත් අසරණ ජනතාව ජීවත්වන ස්ථානයක් වන බැවින් , එක් වැඩිහිටියෙකුට නඩත්තු ආධාර ලෙස දිනකට රජයෙන් ගෙවනු ලබන්නේ රු.12.00 ක් වැනි ඉතා සුළු මුදලක් වන බැවින් අසරණ ජනතාව කුසගින්නේ තැබිය නොහැකි බවත් , සතුන් ඇතිකරන්නේ ද ආර්ථික ප්‍රශ්න වලට යම් පිළිතුරක් සොයා ගැනීමට වන අතර , මෙම සතුන් මහජන සෞඛ්‍යයට හානිදායක නොවන ලෙස බව තබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. එබැවින් , යම්කිසි ආකාරයකින් මෙම ඌරු කොටුව මහජන සෞඛ්‍යයට යම් පීඩාවක් ඇති කරන්නේ නම් මහජන සෞඛ්‍යයට හානිදායක නොවන ලෙස උපදෙස් මත නැවත රජයේ බලපත්‍ර සහිතව ඌරු කොටුව පවත්වාගෙන යාමට එමගින් අනුමැතිය ඉල්ලා තිබිණ.

මෙම ඌරු කොටුව ප්‍රදේශවාසී ජනතාවගේ සෞඛ්‍යයට තර්ජණයක් බැවින් , සෞඛ්‍යාරක්ෂිතව ජීවත්වීමට සුදුසු පරිසරයක් සකස් කරදෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ , කිරිදිගල මැද පාර , අංකඃ 29/ඒ දරණ ලිපිනයේ පදිංචි එන්.ජේ.ඒ.එස්.කේ.එන්.සරත්චන්ද්‍ර මහතා විසින් එවා ඇති ලිපියක් ද සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව මහජන පීඩාවක් සිදුවන බැවින් මෙම ඌරු කොටුව ඉවත් කිරීමට තීරණය කරන ලදී.

05:19 බළන්ගොඩ නව බස්නැවතුම්පලේ බස් රථ තදබදය අවම කිරීම සහ සිදුවන රිය අනතුරු අවම කරගැනීම :

බළන්ගොඩ නගරයේ නව බස්නැවතුම්පල නිරීක්ෂණය කිරීමේ දී රත්නපුර,ඉඹුල්පේ , කුඹල්ගම ,දියවින්න ,රාස්සගල ,පින්නවල දක්වා ධාවනය කරන පුද්ගලික බස් රථ ගාලද ලංගම බස්රථ ගාලද මහත් තදබද කාරීත්වයක් පවතින අතර , බස් රථ එකම ස්ථානයකින් ඇතුළු කිරීම හා පිට කිරීම සිදුවන බැවින් , මෙම තදබදය ඇති වන බව නිරීක්ෂණය වී ඇති බැවින් , මෙම බස් රථ තදබදය හා රිය අනතුරු අවම කරගැනීම සඳහා බළන්ගොඩ අලුත් පාරේ ඉදිකර ඇති දොරවෙල නව පාලම අසලින් බස් නැවතුම්පලට ඒමට ඇති කුඩා මාර්ගය පලල් කර පිළියෙල කර දී එම මාර්ගයේ සියලුම බස්රථ ඇතුළු කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඇස්තමේන්තුවක් සකසා මේ සඳහා මාර්ගය ඉදිකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:20 සණ්ඨාර කුළුණක් සෑදීම :

උඩ ඇල්ලෙපොල ශ්‍රී බෝධිමාලාකාරමය විහාරස්ථානයට අඩුපාඩුවක්ව පැවති සණ්ඨාර කුළුණක් සෑදීම සඳහා බළන්ගොඩ උඩ ඇල්ලෙපොල අංකඃ 478 දරණ ලිපිනයේ පදිංචි ඩබ්.එම්.බිසෝ මැණිකේ යන අය මුලිකත්වය ගෙන ඇති අතර , කුළුණ සකස් කිරීමට අවශ්‍ය පහත සදහන් ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලමින් , එම මහත්මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. ගල්
02. වැලි
03. සිමෙන්ති
04. කම්බි කූරු

සභාපති සහ නාගරික මන්ත්‍රීතුමන්ලාගේ අරමුදලින් රු.3000/- ක මුදලක් ලබාදීමට තීරණය කරන ලදී.

05:21 ජනපද පාරේ මඩවගුර ඉවත්කිරීම :

බළන්ගොඩ කිරිදිගල ජනපද පාර , ගම්වාසීන් විසින් එවා ඇති 2009.10.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ ජනපද පාර කේ.කේ.සිරිසේන මහතාගේ ඉඩම ඉදිරිපිට සපත්තු කාණුවක් ඇති අතර , මෙහි වතුර බැසයන්නේ ඔහුගේ ඉඩමට බැවින් ගල් දමා එම වතුර පාර බැසයාම අවහිර කර ඇති බැවින් ,මාර්ගයේ ජලය පිරී විශාල මඩ වගුරක් සෑදී ඇති නිසා මගී ජනතාව හා රථවාහන ගමනා ගමනයට මහත් බාධාවක් වී ඇත. එබැවින් , එම ප්‍රදේශවාසීන්ට සිදුව ඇති හිරිහැරය වලක්වාදෙන ලෙස මගින් ඉල්ලා තිබිණ.
මෙම ස්ථානය පරීක්ෂාකර බලා ස්වභාවික ජලය බැසයාමක් සිදුව ඇත්නම්, ඇස්තමේන්තුවක් සකසා අවශ්‍යතාව ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:22 ආනන්ද මෛත්‍රීය මාවත නම් නොකිරීම :

ඉහත සදහන් කරුණට අදාලව බළන්ගොඩ , උඩුමුල්ල ආනන්ද මෛත්‍රීය මාවත ශ්‍රී නන්දාරාමය විහාරස්ථානයේ විහාරාධිපති , පුජ්‍ය මැදබැද්ද නන්දසාර ස්ථවීරයන් වහන්සේ විසින් එවා 2009.11.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තුඹගොඩ සිට මස්සැන්න මාර්ගය තමා දන්නා කාලයේ සිට භාවිතා කරනු ලැබුවේ ආනන්ද මෛත්‍රීය මාවත යනුවෙනි. නමුත් පසුගිය වකවානුවේ මාර්ග ප්‍රතිසංස්කරණයේ දී අදාළ නාම පුවරුව ඉවත් කිරීමෙන් පසු නැවත සවිනොකරන ලදී. මේ වන විට සමනලවත්ත පාර යනුවෙන් නාම පුවරුවක් සවිකර ඇත. නොබෝ දිනකින් එය සමනලවත්ත පාර වශයෙන් නම් කිරීම සිදුවේවි දැයි විමසමින් , එම මාර්ගය ආනන්ද මෛත්‍රීය මාවත යනුවෙන් නම් කිරීමේ ගැටළුවක් පවතින්නේ දැයි දැනගනු කැමති බව සදහන් කර තිබිණ.

මෙම මාර්ගයේ ආනන්ද මෛත්‍රීය මාවත යනුවෙන් නාම පුවරුව සවිකිරීමට නම් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:23 බළන්ගොඩ තුඹගොඩ ආනන්ද මෛත්‍රීය මාවතේ ප්‍රධාන කාණුව අවහිරවීම සම්බන්ධවයි

බළන්ගොඩ , තුඹගොඩ , ආනන්ද මෛත්‍රීය මාවතේ කාණුපද්ධතිය සැකසීමේ දී ( අලුත්වැඩියා කිරීමේ දී ) විශාල ගල් හිරවීමෙන් කාණු පද්ධතිය අවහිර වී ඇති අතර , මේ හේතුවෙන් කාණු උතුරා දුගද හමන තත්ත්වයකට පත්ව , පරිසරය දූෂණයක් ද සිදුවන නිසා , හැකි ඉක්මණින් කාණු පද්ධතියේ ඇති අවහිරතා ඉවත් කරන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ , තුඹගොඩ , අංකඃ 6/5 ආනන්ද මෛත්‍රීය මාවත යන ලිපිනයේ පදිංචි එම්.අමරසේන යන අය විසින් එවා ඇති 2009.10.12 දිනැති ලිපිය සභාග කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , එම අවහිරතාව ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:24 පුපුලවත්ත ග්‍රාමයට යන මාර්ගය සකස් කිරීම ඃ

ඉහත සදහන් කරුණට අදාළව බළන්ගොඩ, කුමාරගම පුපුලවත්ත ගම්වාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෑතකදී බළන්ගොඩ නගර සභාවට පවරාගත් කුමාරගම ග්‍රාමසේවා වසමට අයත් ශ්‍රී ධර්මානන්ද පිරිවෙන මාර්ගය පාසල් ළමුන් ඇතුළු බොහෝ දෙනෙක් දිනපතාම ගමන් ගන්නා මාර්ගයක් වන අතර , පාර දෙපස වැටවල් බැඳ මාර්ගය අවහිර ඇත. එසේම , අසල්වැසි නිවෙස් වලින් පිටකරනු ලබන අප ජලය කාණු පද්ධතියට හැරවීම නිසා මාර්ගය සෝදා පාළුවට ලක්ව ඇති බැවින් , මෙම මාර්ගය සකස් කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

ඉඩම අත්පත්කරගෙන ජනතාවගේ ප්‍රයෝජනය සදහා ලබාදීම සුදුසු බව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දීමට තීරණය කරන ලදී.

05:25 අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරිම සඳහා නවපොළ භූමියෙන් අලෙවි කුටියක් ලබාගැනීමඃ

සීමාසහිත බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියෙන් පාරිභෝගික ජනතාවට අඩු මිළට ගුණාත්මක බැවින් යුතු භාණ්ඩ සිල්ලරට අලෙවි කිරීම සඳහා අලෙවි කුටියක් නව පොළ භූමියෙන් ලබාදෙන මෙන් ඉල්ලා , සීමාසහිත බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. අදාල ඉල්ලීම ඉටුකිරීමට සභාවේ එකගතාවය පළකරන ලදී.

05:26 මහමෙව්නා පාර සම්බන්ධවයි

ඉහත සදහන් කරුණට අදාළව බළන්ගොඩ , ඇල්ලෙපොල සරස්වතී ජනපද ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් එවා ඇති 2009.10.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශයේ තලංගම ග්‍රාම නිලධාරී වසම හා කුමාරගම ග්‍රාම නිලධාරී වසම යන ග්‍රාම නිලධාරී වසම් දෙකකට අයත්වන සරස්වතීවත්ත

මහමෙවිනා පාර ගම නැගුම වැඩ සටහන යටතේ 2007 වර්ෂයේ තලංගම වසමේ සමෘද්ධි සංවර්ධන සමිතිය විසින් කොටසක් නිමකරන ලදී. මෙම මාර්ගයේ ඉතිරි කොටස මේ දක්වා සාදා නිම නොකිරීම නිසා රජයෙන් මේ සඳහා වැයකල මුදල් හා ගම්වාසීන්ගේ ශ්‍රමය ද අපතේ ගොස් ඇති බැවින් , මෙම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

මාර්ගයේ පවතින අවහිරතා ඉවත් කරන ලෙස නැවත වරක් ප්‍රාදේශීය ලේකම්,බලන්ගොඩ වෙත දැනුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:27 එළවළු කඩ කාමර වල කුළිය වැඩිකිරීම:

උක්ත කරුණට අදාළව පොදු වෙළඳසැල අංක: 07 දරණ කඩ කාමරයේ බදුකරු ඩබ්.එම්.එල්.පී.වීරසිංහ යන විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

තම කඩ කාමරය අනෙක් කඩ කාමර හතරකට පිටුපසින් පිහිටා ඇති නිසා , මුලින් පිහිටි කඩ කාමර වලට සමානව තම කඩ කාමරයට ද කුළිය වැඩිකිරීමෙන් සිදුවන්නේ අසාධාරණයක් බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා තිබිණ.

අදාල ඉල්ලීම ඉටුකල නොහැකි බව දැනුම් දීමට තීරණය කරන ලදී

05:28 බලන්ගොඩ නව බස්නැවතුම්පලහි පිහිටි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක:08/09 හා බී:04 දරණ ස්ථානයන්හි එක් පැත්තකින් පිහිටි බාගයට බැඳි බිත්තිය ඉවත්කොට එම ස්ථානය සඳහා වීදුරු ආවරණයක් දැමීම පිණිස අවසර ඉල්ලීම:

උක්ත කරුණට අදාළව එම කඩ කාමර වල බදුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි සභාගත කරන ලදුව , සැලසුම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

05:29 කාර්යාල උපකරණ ලබාගැනීම :

වැවේවත්ත හා අවට දරුවන් සහ ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කර ඇති වැවේවත්ත ප්‍රජා ශාලාවේ කාර්යාලයට පහත සඳහන් උපකරණ ලබාදෙන ලෙස ඉල්ලමින් , තුඹගොඩ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අවශ්‍ය උපකරණ

01. මේස 01
02. පුටු 02
03. කබඩ් 01
04. ලිපිද්‍රව්‍ය
05. දැන්වීම් පුවරු 01

ඉල්ලා ඇති උපකරණ හා ද්‍රව්‍ය ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:30 පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරුන් සඳහා පුද්ගල හදිසි අනතුරු රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම :

උක්ත කරුණට අදාළව සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා විසින් එවා ඇති 2009.10.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින්ගේ සුභ සාධනය අරමුණු කරගත් පුද්ගල හදිසි අනතුරු රක්ෂන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂන සංස්ථාව විසින් සැලසුම් කර ඇති අතර , මෙය පැය 24 පුරාම ක්‍රියාත්මක වන ලෝක ව්‍යාප්ත රක්ෂණ ආවරණයක් වන බවද , ඒ යටතේ අසාධ්‍ය රෝග , කැරළි

කෝලාහල , ත්‍රස්තවාදී ක්‍රියා සහ ශාරීරික අකර්මන්‍යතා වැනි හානි රාශියක් ආවරණය වන බවද රක්ෂණ සංස්ථාව විසින් දන්වා සිටින අතර , ඉතා සුළු වාරික මුදලකින් මේ ආවරණ හිමිකම් ලබාගත හැකි බවද පැහැදිලි කර ඇති බැවින් , මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධව මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරන ලෙස ඉල්ලා තිබිණ.

අදාල රක්ෂණ ක්‍රමයට දායකවීමට කැමති ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

**05:31 2010 වර්ෂයට වරිපනම් බදු පැනවීම:**

2009 වර්ෂයේ නගර සීමාව තුළ ව්‍යාපාරික ස්ථාන සඳහා 5% ක් ද ගෘහස්ථ ස්ථාන සඳහා 4% ක් වශයෙන් වරිපනම් බදු අයකරනු ලබන බැවින් , 2010 වර්ෂයට ද එම ප්‍රතිශතයන් අනුවම වරිපනම් අයකිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , ඉහත සඳහන් ප්‍රතිශතයන් අනුව වරිපනම් බදු අයකිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**05:32 තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සඳහා අනුමැතිය ලබාගැනීම :**

බළන්ගොඩ නගර සභා සීමාව තුල පිහිටි දේපල තක්සේරු ප්‍රතිශෝධනය කිරීමටත් , අලුතින් එක් වු දේපල තක්සේරු කිරීමටත් සභාවේ අනුමැතිය පතා ලිපියක් සභාගත කරන ලදී.

පළාත් පාලන ගරු අමාත්‍යතුමන්ගේ අනුමැතියට යටත්ව අදාල තක්සේරු ප්‍රතිශෝධනයන් හා අංක:1423/2 දරණ 2005.12.12 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අලුතින් එක් වු ප්‍රදේශයේ පිහිටි දේපල තක්සේරු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05:33 බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ සේවාව ලංසු කැඳවීම :**

2010 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ සේවාව බදුදීම සඳහා ලංසු කැඳවීමට අනුමැතිය පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , පසුගිය වර්ෂයේ අවම ලංසුවට 10% ක මුදලක් වැඩිකර ලංසු කැඳවීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:34 2010 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා මිළදී ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම :

2010 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා මිළදීගැනිම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම මෙම වසරේ දී කල යුතුව ඇති බැවින් ඒ සඳහා අනුමැතිය පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී. මේ සඳහා අනුමැතිය ලබාදුන් සභාව , පුවත්පත් දැන්වීමක් මගින් අදාල කාරණය ප්‍රසිද්ධියට පත්කිරීමට තීරණය කරන ලදී.

05:35 ජාතික සවිය - ගම නැගුම සංවර්ධන වැඩසටහන - 2009
ii අදියර සඳහා ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම

ඉහත සඳහන් කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ විසින් එවා ඇති 2009.10.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2009 වසරේ ජාතික සවිය - ගම නැගුම සංවර්ධන වැඩ සටහන ii අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම සඳහා ව්‍යාපෘති යෝජනා හඳුනා ගත යුතුව ඇති අතර , එම යෝජනා තෝරා ගැනීමේ දී ජීවනෝපාය සංවර්ධන යෝජනා සඳහා

ප්‍රමුඛතාව ලබාදිය යුතු බවට ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී ඇති බැවින් , ජන සභා රැස්වන දිනයේ දී ඒ සඳහා සහභාගී වීමට හැකි වන පරිදි අදාළ වසම සම්බන්ධීකරණය කරන ගරු නාගරික මන්ත්‍රීතුමා දැනුවත් කරන ලෙස ඉල්ලා තිබිණ.

- දෙහිගස්තලාව වසම

අදාළ වසම භාරව කටයුතු කරන ගරු මන්ත්‍රීතුමා දැනුවත් කිරීම සිදුකරන ලදි.

05:36 බැංකියවත්ත ප්‍රජා ශාලාව පිළිබඳවයි.

ඉහත සඳහන් ප්‍රජා ශාලාවේ සියළුම රැස්වීම් ( සමෘද්ධි රැස්වීම/අවමංගල්‍යාධාර සමිතිය/ග්‍රාම නිලධාරී මහතා පවත්වනු ලබන රැස්වීම් ) පවත්වනු ලබන්නේ උක්ත ස්ථානයේ දී වන අතර , මෙම ගොඩනැගිල්ලට දොරටු තුනක් ඇතත් , ඒ කිසිවකටවත් දොරවල් සවිකර නොමැති බැවින් , සුනඛයින් වැනි සතුන්ගෙන් එම ගොඩනැගිල්ල හා අවට පරිශ්‍රය අපවිත්‍ර ඇති අතර , මෙම ස්ථානයට පැමිණෙන ප්‍රදේශවාසී ජනතාවට විශාල කරදරයක් බැවින් , කම්බි දැල් යොදා මෙය ආවරණය කරන ලෙසත් , මෙම ප්‍රජා ශාලාවට මේසයක් , පුටුවක් හා බංකු කීපයක් ලබාදෙන ලෙස ඉල්ලා තුඹගොඩ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය ඉදිරිපත් තිබු ලිපියක් සභාගත කරන ලදී.

05:37 **කාර්පාක් අංකඃ16 කඩ කාමරයේ බදු අයිතිය පැවරීම :**

ඉහත කඩ කාමරයේ බදුකරුවන එම්.වයි.විලියම්යන අය , බළන්ගොඩ , කරව්කැටිය පාර අංකඃ 54/4 දරණ ලිපිනයේ පදිංචි පී.එම්.එස්.බණ්ඩාර යන අයට උක්ත කඩ කාමරයේ බදු අයිතිය පවරන බව දන්වමින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

කඩ කාමර අතුරු බදුදීම සම්බන්ධව 2009/01 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛනයේ 1:11 හි දක්වා ඇති කරුණු සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බව විෂය භාර නිලධාරී සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී තිබුණි.

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව වාර්ෂික බදු මුදලෙන් 25% ක් අයකර කඩ කාමරයේ බදු අයිතිය ඉහත කී අය නමින් පවරාදීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:38 **බළන්ගොඩ - තානායම් පිවිසුම් මාර්ගයේත් , බාන්ස රත්වත්ත මාවතෙහි ගමනා ගමනයට බාධාවන අයුරින් ගොඩනැගිලි ඉදිකිරීම :**

බළන්ගොඩ තානායම් පිවිසුම් මාර්ගයේ ජේ.එෆ්.සිනමාහල අසල අනවසරයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ල හේතුවෙන් මාර්ගයේ දෙපසින් පැමිණෙන වාහන අනතුරු ලක්වීමට අවධානමක් පවතින බව සඳහන් කරමින් ඒ කෙරෙහි සභාවේ අවධානය යොමු කරමින් බළන්ගොඩ නගරයේ රියදුරු සංගමය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. අනවසර ඉදිකිරීමක් සිදුකර ඇත්නම් එය ඉවත් කිරීමට සභාව තීරණය කරන ලදී.

05:39 **පොදු කටයුතු සඳහා ඉඩමක් ලබාගැනීම :**

බළන්ගොඩ , මිරිස්වත්ත අලාබ්දීන් මාවතේ නගර සභාවට අයත් පර්චස් දහයක (10) පමණ ඉඩම් කැබැල්ලක් පොදු කටයුතු සඳහා මිරිස්වත්ත මුස්ලිම් දේවස්ථානයට ලබාදෙන

ලෙස ඉල්ලමින් , අලාබ්දීන් මාවත ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති 2009.10.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉඩම පැවරීමක් සිදුනොකර අදාල සංවර්ධන කටයුත්ත ඉටුකිරීමට පමණක් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:40 **2010 වර්ෂය සඳහා බදුඅයකිරීම :**

